# ඓතිහාසික රම්බා විහාරය සඳහා උචිත උරුම කළමනාකරණ සැලැසමක් හා එහි න්‍යායාත්මක පසු බිම පිළිබඳ අධ්‍යනයක්

එච්. එච්.අශෝක කරුණාරත්න[1]

ඓතාහාසික උරුමයන් කළමනාකරණය කිරීම පුරාවිද්‍යාඥයාගේ කාර්ය භාරයකි. පෞරාණික උරුමයන් මිහිතලයේ විවිධ විපර්යාස වලට ලක්වෙමින් මේ තුළ ගැබ් වූ තාක්ෂණික ඥාණනය. වාස්තු විද්‍යා ශිල්පය පුරාවිද්‍යාත්මක වටිනාකම, මෙයත් සමගම වැළලී යනු ඇත. පුරාවිද්‍යා උරුම කළමනාකරණය කිරීමේ දී සිදු වනුයේ මේ තත්වය පාලනය කරමින් උරුමය ආරක්ෂා කිරීම පමණක් නොව එය මහජනයා අතර ප්‍රචලාත කරමින් ඓතිහාසික වටිනාකම වර්ධනය කිරීමත් අනාගත පරපුර සඳහා පවත්වාගෙන යාමත් ය. මේ කාර්යය කිරීම උරුම කළමනාකරණ උරුමයන් කළමනාකරණ සැලැස්මකින් කළහැකි නමුත්  මෙය විධිමත් පරිදි සංවිධානාත්මක ක්‍රමවේදයක් අනුව සැලසුම් කිරීම පුරාවිද්‍යාඥයාගේ කාර්ය භාරයකි.

පුරාවිද්‍යා  උරුමයක් කළමනාකරණය කිරීමේ දී එහි අගයන් හඳුනාගැනීම පළමු වෙන්ම සිදු කළ යුතුය. එම අගයන්, ආගමික, අධ්‍යාපනික, වාස්තු විද්‍යාත්මක, සාමාජීය, සෞන්දර්යාත්මක ලෙස හඳුනාගැනීම වැදගත්ය. එම අගයන් හඳුනා ගැනීමෙන් ඉක්බිති සුවිශේෂීතා ප්‍රකාශයක් සකස් කිරීම සිදු කළ යුතුය. මෙහි දී පුරාවිද්‍යා ස්මාරකයේ සියලු වටිනාකම් සාරාංශ ගතකරමින් දැක් විය යුතුය. එම සුවිශේෂීතාවය ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස් කළ යුතු අතරම එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිර්ණායක ද උරුමය කළමනාකරණ සැලසුමකට අන්තර්ගත විය යුතුය. එමෙන් පසු විපරම් කිරීම උරුම කළමනාකරණ සැලසුමක අනිවාර්ය ලක්ෂණයකි. උරුම කෙතරම් දුරට සාර්ථකව කළමනාකරණය කළ ද පසු විපරම් කිරීම විධිමත් අයුරින් සිදු නොවන්නේ නම් උරුමය අනාගත පරපුර වෙනුවෙන් පවත්වා ගෙන යාමට ඉඩ කඩ ඇහිරී යනු ඇත.

මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ බවට පත් වූයේ ඓතිහාසික රම්බා විහාරයේ පුරාවිද්‍යාත්මක වටිනාකම හදුනාගැනීමත්, රම්බා විහාරයට යොග්‍ය උරුම කළමනාකරණ සැලසුමක් ක්‍රියාත්මක කිරීම තුළින් ඓතිහාසික වටිනාකම ජනතාව අතර ප්‍රචලිත කිරීමත්, එම උරුමය අනාගත පරපුර වෙනුවෙන් පවත්වා ගෙන යාමත් සඳහාය.

**ප්‍රමුඛ පදඃ** උරුමය කළමනාකරණය, පුරාවිද්‍යා, පසු විපරම්

---

1 පුරාවිද්‍යා විශේෂවේදී අවසන් වසර ශ්‍රී ජයවර්ධනපු විශ්වවිද්‍යාලය
යය්ගන්්රමබ්ර්එයබ්ටප්සකගජදප